**අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2019**

**------------------------------------------------------------**

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2016 දෙසැම්බර් 01 දිනැති අංක සීඑල්කේ - 100901 ආර් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2017 අගෝස්තු 31 වන දින එළඹි සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.4 වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

**------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රැක ගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,779.95 කට සමාන යුරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු. මිලියන 8,149.96 කට සමාන යුරෝ මිලියන 52 ක් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර ව්‍යාපෘතියෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂයට අදාල රු.මිලියන 3.99 ක උපචිත වියදම් ලෙජර් ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි. | වර්ෂය සඳහා වූ නිවැරදි ලෙජර් ශේෂයන් ගිණුම් මඟින් නිරූපණය නොවීම හා උපචිත වියදම් අඩුවෙන් දැක්වීම. | ව්‍යාපෘතිය ලෙජර් ගිණුම් මුදල් පදනම මත පවත්වාගෙන යනු ලබයි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා උපචිත පදනම යොදාගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ වැඩකටයුතුවල භෞතික කාර්යසාධනය**

| | සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණය | බලපෑම | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| (අ) | අනුරාධපුර නගරයේ තිරසාර යටිතල පහසුකම් හඳුනා ගැනීම | විස්තරාත්මක නිර්මාණකරණ අධ්‍යයනය සඳහා උපදේශක සේවා | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ 3 ක් ඉක්මවා තිබුණද, විස්තරාත්මක අධ්‍යයන වාර්තාවක් ලබා දීමට ප්‍රමාද වීමත් එම වාර්තා ප්‍රමාදයකින් තොරව සමාලෝචනය කිරීමට අවශ්‍ය විශේෂඥ දැනුමක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට | ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් නිම කිරීමේ කාලය දීර්ඝ කිරීමට සිදු වීම නිසා එම ප්‍රමාදය ව්‍යාපෘතියේ සමස්ථ සැලසුම්ගත කාලය කෙරෙහි බලපෑම | උපදේශන වාර්තා සමාලෝචනය කිරීමට අපොහොසත් වීම. | විශේෂඥ දැනුම් පරතරය හේතුවෙන් ව්‍යාපෘතියෙහි ප්‍රධාන සැලසුම් 2 ක හා ශක්‍යතා අධ්‍යයන වාර්තා 2 ක ප්‍රගතිය ප්‍රමාද වීම කෙරෙහි පමණක් බලපාන ලදී. | ප්‍රධාන විශේෂඥයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | නොවීමත් හේතුවෙන් රු.මිලියන 7,460.35 (යුරෝ මිලියන 47.6) ක ප්‍රතිපාදන උපයෝජනය කර ක්‍රියාත්මක කිරීමට යෝජිත කාර්යයන් විස්තරාත්මකව සැලසුම් කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. | | | | |
| (ආ) | අනුරාධපුර නගරයේ තිරසාර යටිතල පහසුකම් හඳුනා ගැනීම | විස්තරාත්මක නිර්මාණකරණ අධ්‍යයනය සඳහා උපදේශක සේවා | උපදේශක සේවා ආයතන විසින් මාස 15 ක ප්‍රමාදයකින් පසුව 2020 ජනවාරි 30 දින උපදේශන වාර්තා භාරදී තිබුණද, එම වාර්තාවල නිරීක්ෂණය වූ අඩුපාඩු හේතුවෙන් එම වාර්තා ව්‍යාපෘතිය විසින් පිළිගෙන නොතිබුණි. මෙම නිසා ව්‍යාපෘතියෙහි වැඩකටයුතු නිම කිරීමේ කාලය තවදුරටත් ප්‍රමාද වී තිබුණි. උපදේශක සේවා ගිවිසුමේ 46.2 වගන්තිය ප්‍රකාරව ප්‍රමාදය සම්බන්ධයෙන් උපදේශ සේවා ආයතන ඉදිරිපත් කර තිබුණු කරුණු ප්‍රමාදයට අදාල කරුණු ලෙස පිළිගත නොහැකි විය. එසේ වුවත් මෙකී ප්‍රමාදය සම්බන්ධව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට | ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් නිම කිරීමේ කාලය දීර්ඝ කිරීමට සිදු වීම නිසා එම ප්‍රමාදය ව්‍යාපෘතියේ සමස්ථ සැලසුම්ගත කාලය කෙරෙහි බලපෑම | උපදේශකවරුන් ගේ දුර්වල කාර්යසාධනය සහ අධීක්ෂණයක් නොවීම. | ගිවිසුම්වල සඳහන් අතිරේඛ ප්‍රතිපාදන ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධව අනුගමනය කරනු ලැබේ. | උපදේශන සේවා ගිවිසුම්වල සඳහන් මග පෙන්වීම් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වයාපෘතියේ නිලධාරීන් කටයුතු කර නොතිබුණි. | | |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| විස්තරාත්මක උපදේශක වාර්තා ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඇති වී තිබුණු අහිතකර බලපෑම සමනය කර ගැනීම පිණිස, ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 748.5 ක් වූ කඩිනමින් නිම කළ හැකි උප ව්‍යාපෘති 5 ක් හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, මෙම කොන්ත්‍රාත්වල ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කර අවසන්ව තිබුණද, එම කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යා හැකි අතර ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය දීර්ඝ කිරීමටද සිදුවිය හැකිය. | කඩිනමින් නිම කළ හැකි උප ව්‍යාපෘති ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන්ම ව්‍යාපෘතියට පාලනය කළ නොහැකි ප්‍රතිලාභීන්ගේ විරෝධතා හේතු විය. | කොන්ත්‍රාත් වැඩකටයුතු කඩිනමින් නිම කිරීමට අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මගින් ලබාදී තිබුණු රු.මිලියන 8,149.96 කට සමාන යුරෝ මිලියන 52 ක මුදලින්, ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දිනට අවුරුදු 3 ක් ගත වී තිබුණද උපයෝජනය කර තිබුණේ යුරෝ මිලියන 1.40 කට සමාන රු.මිලියන 225.10 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් | ව්‍යාපෘතියෙහි සැලසුම්ගත කාලපරිච්ඡේද ය තුළ ව්‍යාපෘති කාර්යයන් නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘති | එකඟ වේ. ව්‍යාපෘතියෙහි විස්තරාත්මක නිර්මාණ කටයුතු සඳහා ලබාගත් උපදේශන සේවාවන් සැපයීමේ ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රධාන වශයෙන්ම අරමුදල් ඌන උපයෝජනය සිදුවිය. | ව්‍යාපෘතියේ අරමුදල් කාර්යක්ෂමව හා ආර්ථිකමය වශයෙන් උපයෝජනය සඳහා ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| සියයට 3 ක් පමණි. එසේම ව්‍යාපෘතිය මගින් ඉකුත් වර්ෂයේදී යුරෝ මිලියන 1.72 කට සමාන රු.මිලියන 204.25 ක් ව්‍යාපෘතිය ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් කිසිවක් ලබාගෙන නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම ඉකුත් වර්ෂයේදී ලබාගෙන තිබුණු අත්තිකාරම් මුදලින් යුරෝ මිලියන 0.58 කට සමාන රු.මිලියන 94.37 ක් උපයෝජනය කිරීමකින් තොරව බැංකු ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | අරමුදල් ඌන උපයෝජනය වීම. | | |

### 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාල නිරීක්ෂණ

---------------------------------------------------

2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි සමස්ථ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 28 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එයින් නාගරික ජාතික උරුමයන් පිළිබඳ විශේෂඥ, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු 3 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 4 ක් ඇතුලු තනතුරු 10 ක් පුරප්පාඩුව පැවති නමුත් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අනුරාධපුර උප ව්‍යාපෘතියෙහි අතිරේඛ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ නිවාස කුලී පදනම මත ලබා ගැනීමට කැඳවා තිබුණු සමාන මිල ගණන් පදනම් කරගෙන ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම සඳහාද නිවාසයක් බදු පදනම මත ලබාගෙන තිබුණි. කාර්යාල පරිශ්‍රය බදු පදනම මත ලබා ගැනීම සඳහා 2018 නොවැම්බර් 14 දින රු.100,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එසේ වුවත්, මෙකී නිවාසය ව්‍යාපෘති කාර්යාලය වෙනුවෙන් බදු පදනම මත ලබාගෙන නොතිබුණු අතර ගෙවා තිබුණු අත්තිකාරම් මුදල් 2020 මැයි මාසය දක්වාම නැවත අයකර ගෙන නොතිබුණි. | මෙම තත්ත්වය උල්ලංඝනය කිරීමක් වන අතර මෙවැනි ගනුදෙනු රජයේ මුදල් අවභාවිතයට තුඩුදෙන කරුණක් වේ. | අත්තිකාරම් මුදල නැවත පියවන ලෙස ගොඩනැගිලි හිමිකරු වෙත ව්‍යාපෘති කාර්යාලය මගින් කීපවාරයක් දැනුම් දී තිබුණද, ගොඩනැගිලි හිමිකරු විසින් එම අත්තිකාරම පියවීම ප්‍රතික්ෂේප කරන ලදී. මේ සම්බන්ධව නීතිමය පියවර ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | අත්තිකාරම් මුදල පියවා ගැනීමට අවශ්‍ය කඩිනම් හා නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |